බාලවයස් ලිංගික අපරාධයක් වාර්තා කිරීමේදී මාධ්‍ය මනා ප්‍රවේසමක් සහ ආචාර ධාර්මික ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බව අමුතුවෙන් කිව යුතු නොවේ.

විශේෂයෙන්ම ලිංගික අපරාධයකට මුහුණ දුන් අයෙකුගේ අනන්‍යතාවය හෙළි කිරීම කිසිසේත්ම නොකළ යුතු වේ. එය පුවත් වාර්තාවක් ඔස්සේ වක්‍රාකරයෙන් අනන්‍යතාවයන් හෙළි වීමට ද අදාළ වේ.

එනම්, ලිංගික අපරාධයක සැකකරුගේ හෝ වරදකරුගේ අනන්‍යතාවය හෙළි කරමින්, එම ලිංගික අපරාධයට මුහුණපෑ අය එම සැකකරුට/වරදකරුට දරණ ඥාතීත්වය හෙළිදරව් කිරීම ද, ලිංගික අපරාධයකට මුහුණ දුන්න අයෙකුගේ අනන්‍යතාවය වක්‍රාකාරයෙන් හෙළි කිරීමක් ලෙසින් ගණන් ගත හැක.

නිදසුනක් ලෙසට, බාලවයස් ලිංගික අපරාධයක් සඳහා වරදකරු වූ එම සිදුවීමට මුහුණ දුන් අයගේ බාප්පාට දඬුවම් නියම වීමේ පුවත දිනමිණ වාර්තා කර ඇති ආකාරය සලකා බැලිය හැක. එම ඥාතීත්වය සඳහන් කරන පුවත් වාර්තාව, ඒ සමඟින් සැකකාර බාප්පාගේ නම සහ ලිපිනයද සඳහන් කරයි.

ඔබ සිතන ලෙසට,

1) මෙම දිනමිණ පුවත ඔස්සේ ලිංගික අපරාධයට ලක්වූ බාලවයස්කාරියගේ අනන්‍යතාවය හෙළි වීමේ අවදානමක් නැති ද?

2) මෙම ලිංගික අපරාධය "හදි කිරීමක්" ලෙසින් සිරස්තල තුළ දැක්වීම, ලිංගික අපරාධයක් සැහැල්ලු කොට වාර්තා කිරීමක් නොවන්නේ ද?

ලිංගික අපරාධ වගකීමෙන් යුතුව වාර්තා කරමු!

මූලාශ්‍ර:

https://pressgazette.co.uk/news/identifying-sex-crime-victims-to-people-while-newsgathering-is-breach-of-code-ipso-clarifies/

https://www.ipso.co.uk/editors-code-of-practice/

https://www.editorscode.org.uk/the_code.php

https://www.ipso.co.uk/media/1723/sex-off-journo_v4.pdf

